සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 12 - 2023

28 SI

විභාග අංකය: ....

28 ගෘහ ආර්ථික විද්‍යාව - I

කාලය පැය 02 යි

- **සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

(01) නිර්මාණකරණයේදී ශාන්ත බව හා නොසන්සුන් බව හැඟවීමට යොදා ගන්නා රේඛා වර්ගය වනුයේ පිළිවෙලින්,

(1) සිරස් හා තිරස් රේඛා ය. (2) තිරස් හා විකර්ණාකාර රේඛා ය
(3) තිරස් හා අක්වක් රේඛා ය. (4) සිරස් හා වක්‍ර රේඛා ය
(5) වක්‍ර හා විකර්ණාකාර රේඛා ය

(02) අභ්‍යන්තර අවකාශ නිර්මාණකරණය සම්බන්ධ ව ඇති සාවද්‍ය ප්‍රකාශය වනුයේ,

(1) වහලයට හා සිවිලිමට ඇස්බැස්ටස් භාවිතය අවම කළ යුතුය.
(2) අභ්‍යන්තර අවකාශයට ගැළපෙන පරිදි ගෘහ භාණ්ඩ තෝරා ගත යුතුය.
(3) සුදු පැහැ පොළොව අවකාශයේ ප්‍රමාණය කුඩා කර පෙන්වයි.
(4) සණකම් සහිත බිත්ති නැගෙනහිර හා බස්නාහිර දිශාවට යොදා ගැනීම සුදුසු වේ.
(5) කෘත්‍රිම ආලෝකයේ තීව්‍රතාව Lux ඒකකවලින් මනිනු ලැබේ.

(03) ප්‍රාථමික වර්ණයක් හා ඊට යාබදව ඇති ද්විතීක වර්ණයක් සමාන ප්‍රමාණවලින් මිශ්‍ර කිරීමෙන් සාදා ගන්නා වර්ණ හඳුන්වනුයේ,

(1) තෘතියික වර්ණ ලෙස ය. (2) මූලික වර්ණ ලෙස ය. (3) ද්විතීක වර්ණ ලෙස ය.
(4) උදාසීන වර්ණ ලෙස ය. (5) අන්තර් මාධ්‍යමික වර්ණ ලෙස ය.

(04) නූතන සංකල්පයට අනුව ඉදි වූ ගොඩනැගිල්ලක දක්නට ලැබෙන ලක්ෂණයක් නොවනුයේ,

(1) විවිධ වර්ණ වලින් යුක්ත වීම.
(2) කොන්ක්‍රීට් හා වීදුරු භාවිතා කිරීම.
(3) ජ්‍යාමිතික හැඩතලවලට මුල් තැන දීම.
(4) කැටයම් රහිත වීම.
(5) වර්ණ භාවිතය අඩු වීම.

(05) ගොඩනැගිල්ලක ''සැකැස්ම හා පිහිටීම'' තීරණය කරනු ලබන සාධකයක් නොවන්නේ මින් කුමක්ද?

(1) භූ විෂමතාවය (2) සංවහන රටා
(3) දිශානතිය (4) භූමියේ ශාක ගහණය
(5) භූමියේ ජල වහන තත්ත්වය

(06) සෞන්දර්යාත්මක බවට ප්‍රමුඛත්වය දී සාදා ඇති ගොඩනැගිල්ලකි

(1) ජාතික කෞතුකාගාරය (2) දළදා මාළිගාව (3) ගාලු කොටුව
(4) ලිබර්ටි ප්ලාසා ගොඩනැගිල්ල (5) නෙලුම් පොකුණ

(07) කිසියම් නිර්මාණයක මතුපිට පෘෂ්ටය ස්පර්ශ කිරීමෙන් දැනෙන ස්වභාවය,

(1) හැඩයයි (2) වයනයයි (3) සමමිතියයි
(4) අවධාරණයයි (5) වටිනාකමයි

(08) පුනර්ජනනීය ශක්ති ප්‍රභවයක් නොවනුයේ,

(1) ගල් අඟුරු (2) ජල විදුලිය (3) ජීව වායුව

(4) සූර්ය කෝෂ (5) උදම් රළ

(09) චිත්‍ර ශිල්පීන් තම නිර්මාණවල සමානුපාතික බව ඇති කිරීමට යොදා ගන්නා සංකල්පයකි,

(1) හරිත සංකල්පය (2) වර්ණ ගැළපුම්

(3) ෆයබොනාසි චක්‍රය (4) රිද්මය

(5) කලාත්මක බව

(10) අත්‍යාවශ්‍ය නොවන ඇමයිනෝ අම්ල දෙකකි,

(1) ලයිසින් හා ලියුසින් ය. (2) හිස්ටිඩින් හා ඇලනීන් ය.

(3) ත්‍රියෝනින් හා සෙරීන් ය. (4) ඇලනින් හා ආජිනින් ය.

(5) මෙතියෝනින් හා වැලීන්ය.

(11) ඩයිසැකරයිඩයක් වන මෝල්ටෝස් අණුවක් නිවැරදි ව සෑදෙන ආකාරය දැක්වෙන පිළිතුර වනුයේ,

(1) ග්ලූකෝස් අණු 1 + ෆ්රක්ටෝස් අණු 1

(2) ග්ලූකෝස් අණු 1 + ගැලැක්ටෝස් අණු 1

(3) ෆ්රක්ටෝස් අණු 1 + ෆ්රක්ටෝස් අණු 1

(4) ග්ලූකෝස් අණු 1 + ග්ලූකෝස් අණු 1

(5) ෆ්රක්ටෝස් අණු 1 + ගැලැක්ටෝස් අණු 1

(12) හෙලිකොබැක්ටර් පයිලෝරි නම් ක්‍ෂුද්‍රජීවී විශේෂය හේතු කොටගෙන හට ගන්නා බෝ නොවන රෝගයකි,

(1) දියවැඩියාව (2) කොළරාව

(3) ආමාශයික ප්‍රදාහය (4) පාචනය

(5) ආඝාතය

(13) පෝෂ්‍ය පදාර්ථ හඳුනා ගැනීමේ පරීක්ෂණයක දී පොටෑසියම් හයිඩ්‍රොක්සයිඩ් හා කොපර් සල්ෆේට් යොදා ගන්නා ලදි. මෙමඟින් හඳුනාගත් පෝෂ්‍ය පදාර්ථය වන්නේ,

(1) සුක්රෝස් (2) ග්ලූකෝස්

(3) ලිපිඩ (4) පිෂ්ටය

(5) ප්‍රෝටීන්

(14) ආහාර ජීර්ණයේ දී තෛලෝදකරණ ක්‍රියාවලියට භාජනය වන පෝෂකය වනුයේ,

(1) කාබෝහයිඩ්‍රේට් ය. (2) ප්‍රෝටීන්ය.

(3) පොලි සැකරයිඩය. (4) ලිපිඩය.

(5) ඩයි සැකරයිඩය.

(15) එක්තරා බෝ නොවන රෝගයක සංකූලතා කිහිපයක් පහත දැක්වේ,

- මළ බැහැර කිරීමේ අපහසුතාව
- හිසරදය
- ආහාර ගැනීමට ප්‍රිය නොවීම
- ගුදය ආශ්‍රිත අපහසුතා

ඉහත සංකූලතා පෙන්වන රෝගය වන්නේ,

(1) දියවැඩියාවයි (2) මළ බද්ධයයි

(3) හෘදයාබාධයි (4) පිළිකායි

(5) ස්ථුලතාවයයි.

(16) පුරුෂයකුගේ ඉණේ වට ප්‍රමාණය 36" කි. උකුලේ වට ප්‍රමාණය 40" කි. මොහුගේ ඉණ හා උකුළ අතර අනුපාතය වනුයේ,

(1) 0.5 කි

(2) 0.6 කි

(3) 0.7 කි

(4) 0.8 කි

(5) 0.9 කි

(17) අමාශයික ප්‍රදාහය වැළඳී ඇති පුද්ගලයෙකු සඳහා යෝග්‍යතම ආහාර ඇතුළත් පිළිතුර වනුයේ,

(1) තම්බපු හාලේ බත්, කිරට පිසූ මාළු, සව් කැඳ (2) නිවුඩු හාලේ බත්, තක්කාලි සලාද, මිරිසට පිසූ පරිප්පු
(3) කහ බත්, අල බැදුම, කුකුළු මස් ඩෙවල් (4) බිරියානි, පොල් චට්නි, චිකන් කුරුමා
(5) රතු බත්, මිශ්‍ර එළවළු සලාදය, මුදවපු කිරි

(18) තෛපොංගල් උත්සවයක් සඳහා සුදුසු ආහාර වේල කුමක්ද?

(1) පොංගල් බත්, වටලප්පන්, ගුලාබ් ජාමුන් (2) ඉඹුල් කිරිබත්, මස්කට්, රුලං ලඩ්ඩු
(3) පොංගල් බත්, ලඩ්ඩු, කේසරි (4) බිරියානි, මස්කට්, වටලප්පන්
(5) මස්කට්, උප්පුමා, මසල වඩේ

(19) මස්වල තද කොටස් මෘදු වීමට පිස ගත හැකි පිසීමේ ක්‍රමය හඳුන්වනුයේ,

(1) බ්‍රේස්ට් කිරීම යනුවෙනි. (2) හුමාලයෙන් තැම්බීම යනුවෙනි.
(3) රෝස්ට් කිරීම යනුවෙනි (4) ස්ටූ කිරීම යනුවෙනි.
(5) ග්‍රිල් කිරීම යනුවෙනි.

(20) සහල් පිසීමේ දී පිෂ්ට කණිකා පුපුරා දිය වීම සිදුවේ. මෙම ක්‍රියාවලිය හඳුන්වනුයේ,

(1) ඩෙක්ස්ට්‍රීකරණය යනුවෙනි. (2) ජෙලටණීකරණය යනුවෙනි (3) කැරමලීකරණය යනුවෙනි.
(4) ඔක්සිකරණය යනුවෙනි. (5) විසරණය යනුවෙනි.

(21) පලතුරු පරිභෝජනය කිරීමෙන් වළක්වාගත හැකි රෝගාබාධ නොවනු යේ,

(1) ඇදුම හා දියවැඩියාව ය
(2) ගලගණ්ඩය හා මැරස්මස් ය.
(3) පිළිකා හා ආතරයිටීස් ය.
(4) අධික රුධිර පීඩනය හා ස්ථුලතාවය.
(5) මළබද්ධය හා හෘදයාබාධ ය.

(22) නිමාලි ලබාගත් උදය ආහාර වේලෙහි පහත සඳහන් ආහාර ප්‍රමාණ අඩංගු වී ය.

- ඉඳි ආප්ප 20 g
- පොල් සම්බල 05 g
- මාළු 05 g

ඉහත සඳහන් ආහාරවල අඩංගු කැලරි ප්‍රමාණය වනුයේ,

(1) 149 kcal (2) 145 kcal (3) 120 kcal
(4) 174 kcal (5) 170 kcal

(23) ආමාශයේ ඇති ප්‍රෝටීන් ජීර්ණය කරන අක්‍රීය එන්සයිම 2 ක් වනුයේ,

(1) පෙප්සින් හා රෙනින් ය.
(2) ට්‍රිප්සීන් හා පෙප්සීන් ය.
(3) පෙප්සිනෝජන් හා ප්‍රෝරෙනින් ය.
(4) ට්‍රිප්සිනෝජන් හා පෙප්සිනෝජන් ය.
(5) පෙප්ටයිඩේස් හා ලයිපේස් ය.

(24) විටමින් B_{12} හි රසායනික නාමය වනුයේ

(1) තයමින් යනුවෙනි. (2) නියැසින් යනුවෙනි.
(3) සයනොකොබැලමින් යනුවෙනි. (4) රෙටිනෝල් යනුවෙනි.
(5) බයොටින් යනුවෙනි.

(25) ප්‍රතිඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කරන පෝෂකය කුමක්ද?

(1) විටමින් C ය. (2) විටමින් D ය.
(3) විටමින් K ය (4) සෝඩියම් ය.
(5) යකඩ ය.

(26) මස්, මාළු හා කිරි, බිත්තර පිළිබඳ සටහනක පහත සඳහන් කරුණු ඇතුළත් ව තිබුණි.

A - දෛනික ශක්ති අවශ්‍යතාවයෙන් 10-15% ක් පමණ ප්‍රෝටීන් මඟින් සපයයි.

B - මාළු හා කරවල ඉහළ ගුණාත්මක ප්‍රෝටීන ප්‍රභව වේ.

C - ශරීරයට අත්‍යවශ්‍ය මේද අම්ලයක් වන ඔමේගා 6 මේද අම්ලය මාළුවල බහුලව අඩංගු වේ.

D - සත්වමය ආහාරවල අඩංගු යකඩවලට වඩා ශාකමය ආහාරවල අඩංගු යකඩ ශරීරයට පහසුවෙන් අවශෝෂණය වේ.

මේවායින් නිවැරදි කරුණ වනුයේ

(1) A හා C ය. (2) C හා D ය. (3) A හා D ය.

(4) B හා C ය. (5) A හා B ය.

(27) විටමින් වර්ග හා ඛනිජ ශරීරයට අවශෝෂණය වීම සඳහා බාධා කරන සාධකයක් නොවන්නේ,

(1) ආහාර වේලෙහි විටමින් C අඩංගු වීම (2) නිවුඩු සහල්වල අඩංගු ෆයිටික් අම්ලය

(3) මානසික ආතතිය (4) කැෆේන් අඩංගු පාන වර්ග

(5) තේවල අඩංගු ටැනින්

(28) කාන්තාවන් සහ ගර්භනී මව්වරුන් කැල්සියම් ඌනතාවයට ගොදුරු වීමෙන් හට ගන්නා රෝගී තත්වයකි.

(1) ඔස්ටියෝ පොරෝසීස් (2) ඔස්ටියෝ මැලේෂියා (3) සිරෝසීස්

(4) අස්ථි ක්ෂීණතාවය (5) රිකට්සියාව

(29) ශ්වසන රෝග, සරම්ප, පාචනය, මැලේරියාව යන රෝග ඇති වීම කෙරෙහි බලපාන විටමිනයකි.

(1) විටමින් C (2) විටමින් B (3) විටමින් A

(4) විටමින් E (5) විටමින් K

(30) සින්ක් බහුල ව අඩංගු මාෂබෝගයකි.

(1) බඩඉරිඟු (2) කුරක්කන් (3) බාර්ලි

(4) සහල් (5) බෝංචි

(31) පෝෂණ ගැටලු හා දුෂ්පෝෂණය වැළැක්වීමට සම්බන්ධ වන රාජ්‍ය සංවිධානයක් නොවන්නේ,

(1) අධ්‍යාපන අමාත්‍යාංශය (2) පෝෂණ අංශය

(3) වෛද්‍ය පර්යේෂණ ආයතනය (4) යුනිසෙෆ් සංවිධානය

(5) කෘෂිකර්ම අමාත්‍යාංශය

(32) පරිභෝජනයට ගන්නා නොපිසූ ආහාර 100g ක අඩංගු පෝෂක ප්‍රමාණය දැක්වෙන සටහන හඳුන්වන නම කුමක්ද?

(1) පෝෂණ වගුව (2) ආහාර පිරමීඩය (3) ආහාර පිඟාන

(4) දෛනික පෝෂණ අවශ්‍යතා සටහන (5) ආහාර පංගුව

(33) ශ්‍රී ලංකාවේ අඩු බර දරු උපත් වැඩි ප්‍රමාණයක් වාර්තා වන දිස්ත්‍රික්කය වනුයේ,

(1) මහනුවර (2) බදුල්ල (3) ත්‍රිකුණාමලය

(4) මඩකලපුව (5) නුවර එළිය

(34) පුද්ගලයෙකු උසට සරිලන බරකින් යුක්ත බව නිර්දේශ කර ඇත. ඒ අනුව ඔහුගේ BMI අගය විය හැක්කේ,

(1) 18.5 ට අඩු ය. (2) 18.5 - 24.9 ට අතර ය. (3) 25 - 30 අතර ය.

(4) 30 ට වැඩි ය. (5) 18.5 - 25 අතර ය.

(35) අමු කරි කුඩු මිශ්‍රණය හා බැදපු කරි කුඩු මිශ්‍රණය සැකසීමේ දී සූදුරු හා මාදුරු යොදා ගන්නා අනුපාතය නිවැරදිව දැක්වෙන පිළිතුර වනුයේ,

(1) 2 : 1 (2) 1 : 1 (3) 2 : 2

(4) 1 : 3 (5) 3 : 1

(36) මිරිස්, ගම්මිරිස් හා ඉඟුරුවල සැර ගතිය ඇති වීමට බලපාන කාරක පිළිවෙලින්,

(1) ජින්ජරෝල්, පිපෙරින්, කැප්සෙසින් (2) පිපෙරින්, ජින්ජරෝල්, කැප්සෙසින්

(3) කැප්සෙසින්, පිපෙරින්, ජින්ජරෝල් (4) ජින්ජරෝල්, කැප්සෙසින්, පිපෙරින්

(5) කැරොටිනොයිඩ්, ජින්ජරෝල්, පිපෙරින්

(37) නිමි ඇඳුම් අපනයනය කිරීම ආරම්භ වූ වර්ෂය වන්නේ
(1) 1960 දී ය.
(2) 1977 දී ය
(3) 2014 දී ය.
(4) 1964 දී ය
(5) 1970 දී ය.

(38) රෙදි අපතේ යාම අවම වන පරිදි ඇඳුම් කිහිපයක පතොරොම් කපා ගැනීම සඳහා සකසන ලද සටහනකි,
(1) පිරි සැලසුම
(2) මෝස්තර නිර්මාණය
(3) පතරොම් නිර්මාණය
(4) මාකර් සටහන
(5) ජ්‍යාමිතික සටහන

(39) අන්තර් තොණ්ඩු සෑදෙන වාණිජ මැහුම් ක්‍රමයක් වන්නේ,
(1) 301 වර්ගයේ මැහුම් ක්‍රමවල ය.
(2) 304 වර්ගයේ මැහුම් ක්‍රමවල ය.
(3) 100 වර්ගයේ මැහුම් ක්‍රමවල ය.
(4) 201 වර්ගයේ මැහුම් ක්‍රමවල ය.
(5) ඕවර්ලොක් මැහුම් ක්‍රමයේ ය.

(40) පහත සඳහන් රූප සටහනෙහි දැක්වෙන මැහුම් ක්‍රමය කුමක්ද?



(1) අගුලු මැස්ම
(2) අත් මැස්ම
(3) අක්වක් අගුලු මැස්ම
(4) නොපෙනෙ මැස්ම
(5) තනි නූලේ දම්වැල් මැස්ම

(41) දිග හා පළල 100 cm ක් වන සමචතුරස්‍රාකාර මේසයකට මේස රෙද්දක් නිර්මාණය කිරීමේදී යොදා ගත යුතු නිවැරදි මිම් ඇතුළත් පිළිතුර වනුයේ,
(1) 30 cm + 100 cm + 30cm = 160 cm (දිග)
30 cm + 100 cm + 30cm = 160 cm (පළල)
(2) 15 cm + 100 cm + 15cm = 130 cm (දිග)
25 cm + 100 cm + 25cm = 150 cm (පළල)
(3) 25 cm + 100 cm + 25cm = 150 cm (දිග)
25 cm + 100 cm + 25cm = 150 cm (පළල)
(4) 10 cm + 100 cm + 20cm = 130 cm (දිග)
10 cm + 100 cm + 20cm = 130 cm (පළල)
(5) 40 cm + 100 cm + 40cm = 180 cm (දිග)
40 cm + 100 cm + 40cm = 180 cm (පළල)

(42) ගෘහ පිළිවලට අමතරව ඇගලුම් සඳහා යොදා ගන්නා කාර්මික රෙදි වර්ගයක් නොවන්නේ,
(1) මාර්ග සකස් කිරීමේ දී භාවිතා කරන රෙදි
(2) රෝහල් වල භාවිතා කරන වෙලුම් පටි
(3) කෘෂිකර්මාන්තයේ දී භාවිතා වන රෙදි
(4) නැව් හා වාහන වල භාවිතා වන රෙදි
(5) අත් යන්ත්‍ර රෙදි හා ලිනන් රෙදි

(43) රෙදි නිෂ්පාදනයට යොදා ගන්නා කෙඳි වර්ග පිළිබඳව ශිෂ්‍යාවක විසින් ඉදිරිපත් කල කරුණු කිපයක් පහත දැක්වේ.
a) රෙදි නිෂ්පාදනය සඳහා නූල් යොදා ගෙන ඇති අතර නූල් නිෂ්පාදනය කර ඇත්තේ කෙඳි භාවිතයෙනි
b) රෙයෝන් යනු මිනිසා විසින් නිෂ්පාදනය කරනු ලබන කෙඳි වර්ගයකි
c) සීසල් ගසේ කඳේ පිට පොත්ත පල් කර පිරීමකට ලක් කර ලිනන් කෙඳි නිෂ්පාදනය කරයි
d) පටපණු කෝෂ හුමාලයෙන් තම්බා සේද කෙඳි ලබා ගනී
e) නයිලෝන් හා පොලියෙස්ටර් කෙඳි සකස් කරනුයේ ද්‍රව කැටීම මගිනි

මෙම කරුණු අතරින් සාවද්‍ය ප්‍රකාශ වනුයේ,

(1) a හා b (2) c හා e (3) b හා d
(4) b හා c (5) d හා e

(44) පහත සඳහන් වියමන් ක්‍රම 2 පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ


(a)


(b)

(1) දික් දාර වියමන හා හරස් දාර වියමන (2) දික් දාර වියමන හා ජටා වියමන
(3) දික් දාර වියමන හා හීරි වියමන (4) හරස් දාර හා දික් දාර වියමන
(5) චාම් වියමන හා හීරි වියමන

(45) පහත සඳහන් ගෙතුම් ක්‍රමය භාවිතා කර සකසන ලද ඇඳුම් වනුයේ,



(1) ටී ෂර්ට්, මේස් (2) පිහිණුම් ඇඳුම්, මදුරු දැල්
(3) මදුරු දැල්, ටී ෂර්ට් (4) ක්‍රීඩා ඇඳුම්, බ්ලැන්කට්
(5) ඇඳ ඇතිරිලි, වැහි කබා

(46) බිලියට් ක්‍රීඩාවේ මේසයට යොදන රෙද්ද නිෂ්පාදනය කර ඇති නොවියන ලද රෙදි පිළි නිෂ්පාදන ක්‍රමය වනුයේ,
(1) බැඳීම (2) ෆෙල්ට් කිරීම (3) ගෙතීම
(4) ලැමිනේටින් කිරීම (5) බොන්ඩින් කිරීම

(47) පැරපින් ඉටි හෝ ලින්සීඩ් තෙල් භාවිතා කර රෙදි පිළි සඳහා යොදනු ලබන නිමාවක් වනුයේ,
(1) සුව පහසු නිමාව (2) ගිනි රෝධක නිමාව (3) වෙඩි නොවදින නිමාව
(4) ජල රෝධක නිමාව (5) බැක්ටීරියා නාශක නිමාව

(48) කෙටි සායේ ඉණට යොදනු ලබන ශිල්පීය මැහුම් ක්‍රමයක් වනුයේ,
(1) බඳන වාටිය (2) සැඟි වාටිය (3) පැතලි මූට්ටුව
(4) මුහුණත ලා වාටිය (5) ප්‍රංශ මූට්ටුව

(49) කෙටි සායේ පතරොම නිර්මාණයේදී යොදා ගනු ලබන උකුල මිනුම ගණනය කරනු ලබන නිවැරදි ක්‍රමය වනුයේ,

(1) $\frac{\text{උකුල මිනුම}}{2} + 1.5\,\text{cm}$ (2) $\frac{\text{උකුල මිනුම}}{4} + 2.5\,\text{cm}$

(3) $\frac{\text{උකුල මිනුම}}{4} + 1.5\,\text{cm}$ (4) $\frac{\text{උකුල මිනුම}}{2} + 1.5\,\text{cm}$

(5) $\frac{\text{උකුල මිනුම}}{4} + 1.5\,\text{cm}$

(50) සායම් ආලේප කිරීම සඳහා ස්පොන්ජ් කැබැල්ලක් හෝ පින්සලක් හෝ ඉසින යන්ත්‍රයක් භාවිතා කරනු ලබන රෙදි මුද්‍රණ ක්‍රමය වනුයේ
(1) අච්චු මුද්‍රණය (2) බතික් කිරීම (3) තිර රාමු මුද්‍රණය
(4) ස්ටෙන්සිල් මුද්‍රණය (5) එම්බ්‍රොයිඩර් කිරීම

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 12 - 2023

28 S II

විභාග අංකය: ....

28 ගෘහ ආර්ථික විද්‍යාව - II

කාලය පැය 03 යි

සැලකිය යුතුයි :-

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 06 කට පිළිතුරු සපයන්න.

---

01. (i) බාහිර අවකාශ නිර්මාණය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

(ii) බාහිර අවකාශ නිර්මාණයේ දී යොදා ගන්නා අක්ෂ කීයද? ඒ මොනවාද?

(iii) වර්ණ වල ගුණාංග දෙකක් නම් කරන්න.

(iv) කාබන් පා සලකුණු යන්න හඳුන්වන්න.

(v) බහුලව හමුවන පොලිසැකරයිඩ වර්ග දෙකක් නම් කරන්න.

(vi) ශරීරය සෘජුව පවත්වා ගැනීමට වැදගත්වන ව්‍යුහමය ප්‍රෝටීන් වර්ග දෙකක් නම් කරන්න.

(vii) නීරක්තිය ඇති වීමට බලපාන ප්‍රධාන හේතු දෙකක් සඳහන් කරන්න.

(viii) විදුලි සැර වැදීමේදී දිය හැකි ප්‍රථමාධාර දෙකක් සඳහන් කරන්න.

(ix) ආහාර නිෂ්පාදනයේ දී යොදා ගනු ලබන තෛලෝදකාරක දෙකක් නම් කරන්න.

(x) මේස දරණුවක් නිර්මාණය කිරීමේ දී භාවිතා කරනු ලබන මූලික මැහුම් ක්‍රමයක් හා ශිල්පීය මැහුම් ක්‍රමයක් නම් කරන්න. (ලකුණු 2 x 10 = 20)

02. (i) නව නිර්මාණයකදී සලකා බැලිය යුතු උපයෝගිතා සාධක තුනක් නම් කරන්න. (ල. 03)

(ii) නිර්මාණකරණයේ මූලධර්ම තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) හරිත සංකල්පයේ මූලිකාංග හතරක් ලියන්න. (ල. 04)

(iv) අභ්‍යන්තර අවකාශ නිර්මාණයේ දී නිවසකට ස්වභාවික ආලෝකය හා වාතාශ්‍රය මැනැවින් ලැබීමෙන් ඇතිවන ප්‍රතිලාභ සාකච්ඡා කරන්න. (ල. 06)

(මුළු ලකුණු 16)

03. (i) දර්ශීය ඇමයිනෝ අම්ලයක ව්‍යුහ සූත්‍රය ඇද පෙන්වන්න. (ල. 03)

(ii) ලිපිඩ මගින් ජීවීන්ගේ දේහයේ සිදුකරන වැදගත් කෘත්‍යයන් තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) පහත සඳහන් සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

a) ආහාර පිඟාන

b) ආහාර පිරමීඩය (ල. 04)

(iv) උදෑසන ආහාරය ලෙස පාන් පෙත්තක් ආහාරයට ගත් පුද්ගලයෙකුගේ ආහාර ජීර්ණය ක්ෂුද්‍රාන්තයේ දී සිදුවන ආකාරය පැහැදිලි කරන්න. (ල. 06)

(මුළු ලකුණු 16)

04. (i) උදෑසන ආහාර වේල ඉතාමත් වැදගත්ය. කරුණු තුනක් දක්වන්න. (ල. 03)

(ii) බොජුන් පත් සැකසීමේ දී සලකා බැලිය යුතු කරුණු තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) දුෂ්පෝෂණය වැලැක්වීම සඳහා අනුගමනය කල යුතු නිවැරදි ජීවන රටා හතරක් ලියා දක්වන්න. (ල. 04)

(iv) ස්ථූලතාවයෙන් පෙළෙන පුද්ගලයෙකු සඳහා දිනක බොජුන් පතක් සැළසුම් කරන්න. (ල. 06)

(මුළු ලකුණු 16)

05. (i) ආහාර විෂවීම යන්න හඳුන්වන්න. (ල. 03)

(ii) පිටි මෝලියක් සකස් කිරීමේ දී එහි ගුණාත්මකභාවය රැක ගැනීම සඳහා අවධානය යොමු කල යුතු කැරුණු තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) කේක් විසිතුරු කිරීමේ දී යොදා ගන්නා අයිසින් වර්ග දෙකක් නම් කොට ඉන් එකක් පිළියෙල කර ගන්නා අකාරය සඳහන් කරන්න. (ල. 04)

(iv) මුළුතැන්ගෙය තුල දී ආරක්ෂක විධි භාවිතය වැදගත්ය. සාකච්ඡා කරන්න. (ල. 06)

(මුළු ලකුණු 16)

06. (i) නිමි ඇඳුම් කර්මාන්තයේ දී ඇඳුම් මසා නිම කිරීමේ ආකාර 3 කි. ඒ මොනවාද? (ල. 03)

(ii) ගෘහපිළි යන්න හඳුන්වා උදාහරණ 4 ක් දක්වන්න. (ල. 03)

(iii) ගෘහපිළි නිර්මාණයේ දී භාවිතා වන පිරිසැළසුමට ඇතුලත් විය යුතු අංග 4 ක් නම් කරන්න. (ල. 04)

(iv) පහත සඳහන් මාතෘකා ඔස්සේ අත් පිස්නාවකට සුදුසු නිර්මාණයක් සකස් කර ගන්නා ආකාරය පැහැදිල කරන්න.

× ප්‍රමාණය

× සුදුසු මෝස්තරය

× අද්දර නිමාව (ල. 06)

(මුළු ලකුණු 16)

07. (i) ස්වභාවික කෙදි වර්ගීකරණය කර දක්වන්න. (ල. 03)

(ii) කෙඳිවල භෞතික ගුණාංග 3 ක් සඳහන් කරන්න. (ල. 03)

(iii) විශේෂ අවස්ථා වලදී භාවිතා කරන නිමාවන් 2 ක් නම් කර ඉන් එකක් යොදන ආකාරය පැහැදිලි කරන්න. (ල. 04)

(iv) කෙටි සායේ පතරොම නිර්මාණය කිරීමට අවශ්‍ය රාමුව ඇඳ නම් කරන්න. (ල. 06)

(මුළු ලකුණු 16)

08. පහත දැක්වෙන මාතාකා අතුරෙන් 4 ක් තෝරා කෙටි සටහන් ලියන්න.

(i) ජීවන පරිසර නිර්මාණයේ වැදගත්කම

(ii) තෘතියික වර්ණ

(iii) ශරීර ස්කන්ධ දර්ශකය

(iv) පිසීමේ දී පෝෂ්‍ය පදාර්ථ වල සිදුවන විපර්යාස

(v) විරංජනය කිරීම (ලකුණු 4 x 4 = 16)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තෙවන වාර පරීක්ෂණය 2023

12 ශ්‍රේණිය

28 ගෘහ ආර්ථික විද්‍යාව

පිළිතුරු පත්‍රය

28 S I

I කොටස

1 -(2)	2 -(3)	3 -(5)	4 -(1)	5 -(4)	6 -(5)	7 -(2)	8 -(1)	9 -(3)	10-(4)
11-(4)	12-(3)	13-(5)	14-(4)	15-(2)	16-(5)	17-(1)	18-(3)	19-(4)	20-(2)
21-(2)	22-(1)	23-(3)	24-(3)	25-(1)	26-(5)	27-(1)	28-(2)	29-(3)	30-(5)
31-(4)	32-(1)	33-(5)	34-(2)	35-(5)	36-(3)	37-(1)	38-(4)	39-(3)	40-(2)
41-(1)	42-(5)	43-(2)	44-(3)	45-(1)	46-(2)	47-(4)	48-(4)	49-(5)	50-(4)

28 S II

II කොටස

01. (I) බාහිර අවකාශ නිර්මාණය යනු එම ගොඩනැගිල්ල පිහිටි ප්‍රදේශයේ විවිධ ලක්ෂණ පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගෙන ඒවා නිසි පරිදි හසුරුවා ගනිමින් නිර්මාණකරණයේ යෙදීමයි.

(ii) 2යි භෞතික අක්ෂ හා දෘෂ්‍ය අක්ෂ

(iii) වර්ණ නාමය
වටිනාකම
තීව්‍රතාවය

(iv) කාබන් පා සළකුණු යනු හරිතාගාර ආවරණය ඇති කරන වායු කොපමණ ප්‍රමාණයක් පරිසරයට මුදා හරිනු ලබයිද යන්න

(v) පිෂ්ඨය
සෙලියුලෝස්
ග්ලයිකෝජන්

(vi) කොලැජන් හා කෙරටීන්

(vii) යකඩ අඩංගු ආහාර ගැනීම අඩුවීම
යකඩ ප්‍රමාණවත් ලෙස ආහාරයට අවශෝෂණය නොවීම
අධික ලෙස දීර්ඝ කාලීන රුධිර වහනය
පරිපෝෂිත ආසාදන (කොකු පණු රෝගය හා මැලේරියාව)

(viii) ප්‍රධාන ස්විචය ක්‍රියා විරහිත කිරීම
කම්පන වැලැක්වීම
පිලිස්සී ඇත්නම් පිලිස්සුනු ප්‍රදේශ ආවරණය කිරීම
වෛද්‍යවරයෙකු වෙත යොමු කිරීම ආදී ගැලපෙන පිළිතුරු

(ix) බිත්තර කහ මදය, ලෙසිතින්, ප්‍රොපිලින්, ග්ලයිකෝල්, පොස්පොලිපිඩ

(x) සිහින් නූල් දුවවීම - මූලික මැහුම් ක්‍රම
ක්විල්ට් කිරීම, බදන යෙදීම - ශිල්පීය මැහුම් ක්‍රම (ල. 2 x 10 = 20)

02. (i) අනුකූලත්වය
කලාත්මක බව
කාල අවකාශ නිර්ණය කිරීම හා නිර්ණායකයන්ට ගැලපීම
සැකැස්ම හා පිහිටීම
ප්‍රමාණය හා සමානුපාතික බව
වටිනාකම් පද්ධතිය (ල.03)

(ii) තුලනය
රිද්මය
අවධාරණය
ඒකමිතිය
සමෝධානය
සමානුපාතික බව (ල.03)

(iii) අවම ශක්ති පරිභෝජනය
අවම ජල පරිභෝජනය
අපද්‍රව්‍ය අවම කිරීම
ප්‍රවාහණය වෙනුවෙන් වැයවන ශක්තිය අවම කිරීම (ල.04)

(iv) • ස්වභාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා ගැනීමෙන් මුදල් වැය නොවීම
• විදුලිය පිරිමැසීම (මුදල් ඉතිරි වීම)
• සෞඛ්‍යාරක්ෂිත බව
• ස්වභාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා ගැනීම මගින් ප්‍රසන්න ජීවන පරිසරයක් ඇති කර ගැනීම ආදී කරුණු විස්තර කරන්න. (ල. 06)

(මුළු ලකුණු 16)

03. (i)



ශාඛා දාමය — කාබොක්සිල් කාණ්ඩය

ඇමයිනෝ කාණ්ඩය (ල.03)

(ii) ප්‍රෝටීන මෙන්ම ලිපිඩද සෛල පටලවල අඩංගු ප්‍රධාන සංඝටකයක් වන අතර ස්නායු ආවේග සම්ප්‍රේෂණ වන ස්නායු සෛල සෑදී තිබීම.

• ඊස්ට්‍රජන් ටෙස්ටෙස්ටරෝන් කෝටිසෝන් වැනි හෝමෝන වල අන්තර්ගත වීම.
• ශක්ති ප්‍රභවයක් ලෙස ක්‍රියා කරයි. එහෙයින් මේදය ශක්ති ගබඩාවක් ලෙසද සැලකේ.
• දේහයේ මතුපිට ආවරණයේ අන්තර්ගත බැවින් දේහය විජලනය වීම පාලනය වේ.

(12 ශ්‍රේණිය පිටු අංක 35) (ල.03)

(iii) 12 ගුරු අත්පොත 65 - 67 පිටු (ල.04)

(iv) ක්ෂුද්‍රාන්තය තුළදී ආන්ත්‍රික ඇමයිලේස් වලින් පිෂ්ටය මෝල්ටෝස් බවට පත්වේ. තවද ආන්ත්‍රික යුෂයේ අඩංගු පහත සඳහන් ජීර්ණ ක්‍රියා සිදු වේ.

සුක්‍රෝස් $\xrightarrow{\text{සුක්‍රේස්}}$ ග්ලූකෝස් + ෆෘක්ටෝස්

මෝල්ටෝස් $\xrightarrow{\text{මෝල්ටේස්}}$ ග්ලූකෝස් + ග්ලූකෝස්

ලැක්ටෝස් $\xrightarrow{\text{ලැක්ටේස්}}$ ග්ලූකෝස් + ගැලැක්ටෝස් (ල.06)

(මුළු ලකුණු 16)

04. (i) රාත්‍රි ආහාරය ගෙන දිගු වේලාවක් නිරාහාරව සිටීම නිසා පසුදින උදයේ දෛනික ක්‍රියාකාරකම් සඳහා උදය ආහාර වේල වැදගත් වේ.
• රාත්‍රි නිදා සිටින විට පරිවෘත්තීය ක්‍රියා සෙමෙන් සිදුවේ. නමුත් උදෑසන සිට කාර්යක්ෂමව එදිනෙදා කාර්යයන්හි නිරතවීම සඳහා
• නිදි බර බව, අලස බව, ඇති වේ

(පිටු අංක 68 අනුව ලකුණු ලබා දෙන්න) (ල.03)

(ii) පවුලේ ආර්ථික තත්වයට ගැලපීම.
අඩංගු පෝෂ්‍ය පදාර්ථ පිළිබඳ තොරතුරු
ආහාර එකිනෙකට ගැලපීම/නැවුම් බව/පෙනුම
විවිධත්වයෙන් යුක්ත වීම
ආහාර පිළියෙල කිරීමේ දී විවිධ ක්‍රම සලකා බැලීම 69 පිටුව (ල.03)

(iii) දිනපතා ව්‍යායාම සිදු කිරීම.
ආහාර මිලදී ගැනීමේදී ආහාර ලේබල් කියවීම.
නිවසේදී සකසන ලද ආහාර පරිභෝජනය
දුම්පානයෙන් වැළකීම
ශරීර ස්කන්ධය පාලනය කිරීම
මත්ද්‍රව්‍ය ගැනීමෙන් වැළකීම
තන්තු අඩංගු ආහාර දෛනිකව ආහාරයට එක්කර ගැනීම (ල.04)

(iv) සිසු පිළිතුරු අනුව (ල.06)

(මුළු ලකුණු 16)

05. (i) යම් කිසි ආහාරයක් ගැනීමෙන් පසු පැය 1 - 36 අතර කාලයකදී බඩ රිදීම, මළ බුරුල්ව යාම, වමනය, උණ සහ කෙණ්ඩා පෙරළීම යන ලක්ෂණ පෙන්වන්නේ නම් එය ආහාර විෂ වීමක් විය හැකිය. (ල. 03)

(ii) • නිවැරදිඅනුපාතයට අමුද්‍රව්‍ය යොදා ගැනීම
• යොදා ගන්නා අමුද්‍රව්‍ය වල ගුණාත්මක බව
• මිශ්‍ර කිරීමේ නිවැරදි ශිල්පීය ක්‍රම (ල. 03)

(iii) බටර් අයිසින් / රෝයල් අයිසින් / පාච්මන්ට් අයිසින්

බටර් අයිසින්
අවශ්‍ය ද්‍රව්‍ය

- බටර් 35g
- සුදු බටර් 35g
- අයිසින් සීනි 125g
- වැනිලා තේ හැඳි ½
  වර්ණකාරක අවශ්‍ය නම්

සාදන ක්‍රමය
බටර් හා සුදු බටර් අයිසින් සීනි වැනිලා දමා ක්‍රීම් වනතුරු ගසා ගන්න. (අවශ්‍ය නම් වර්ණකාරක එක්කර ගන්න.)

රෝයල් අයිසින්
අවශ්‍ය ද්‍රව්‍ය
බිත්තර සුදු මද 01 / ක්‍රීම් ඔෆ් ටාටර් තේ හැඳි 01 / අයිසින් සීනි 250g / සුවඳ ද්‍රව්‍ය, ආමන්ඩ්, වැනිලා දෙහි යුෂ ස්වල්පයක්

සාදන ක්‍රමය
බිත්තර සුදු මදයට දෙහි යුෂ එක්කර හොඳින් ගසා ගන්න. මෙයට අයිසින්, ක්‍රීම් ඔෆ් ටාටර්, සුවඳ ද්‍රව්‍ය එක් කර මිශ්‍ර කරන්න. ඉක්මනින් වියලෙන නිසා භාවිතයට ගන්නා තෙක් බඳුන රෙදිකඩකින් වසා තබන්න

පාච්මන්ට් අයිසින්
අවශ්‍ය ද්‍රව්‍ය
හලාගත් අයිසින් සීනි 250g / ජෙලටින් මේස හැඳි 01 / උණුවතුර මේස හැඳි 05 / වර්ණකාරක

සාදන ක්‍රමය

- ජෙලටින් උණු ජලයේ දිය කර ගන්න
- ජෙලටින් වලට අයිසින් සීනි එක්කර අතේ නොඇලෙන පදමට ඇඟිලි වලින් මිශ්‍ර කරන්න
- අවශ්‍ය පරිදි වර්ණකාරක එක් කරගන්න

ප්‍රායෝගික ක්‍රියාකරකම් අත්පොත පිටු අංක 86 (ල. 04)

(iv)
- ආහාර පිස ගන්නා බඳුන් ශරීරය ස්පර්ශ නොවන පරිදි තැබීමට වගබලා ගත යුතුයි
- පරිහරණය කරන උඳුන භාජනය ආදිය ගැන අවධානය යොමු කරන්න
- උණුසුම් ආහාර වෙනත් ස්ථානයකට රැගෙන යාමේදී වඩාත් සුපරික්ෂාකාරී වන්න
- භූමිතෙල් ටිනර් හා පෙට්‍රල් වර්ග මුළුතැන්ගෙයි තැබීමෙන් වලකින්න
- මුළුතැන්ගෙයි කසළ බඳුන් රාත්‍රියේදී ඉවත් කරන්න.

පිටු අංක 93 (ල. 06)
(මුළු ලකුණු 16)

06. (i)
- එක් පුද්ගලයකු විසින් සම්පූර්ණ ඇඳුම මැසීම
- ඇඳුමේ විවිධ කොටස් විවිධ පුද්ගලයින් විසින් මැසීම
- කුඩා කණ්ඩායමක් එක්ව එක් ඇඳුමක් මසා නිම කිරීම (ල. 03)

(ii) ගෘහ පිළි යනු ගෙදර දොර එදිනෙදා භාවිතා කරන රෙදි වලින් නිෂ්පාදිත දෑ
උදා: ඇඳ ඇතිරිලි, බිත්ති සැරසිලි, බුමුතුරුණු, මේස දරණු, තුවා, අත් පිස්නා, දූවිලි පිස්නා (ල. 03)

(iii)
- නිර්මාණය කරන ගෘහ පිළි වර්ගය
- යොදා ගන්නා රෙදි වර්ගය, එහි වයනය, වියමනේ ස්වභාවය
- දිග, පළල හා හැඩය
- වර්ණ ගැලපීම
- එහි පතරොම
- මෝස්තරය
- මැහුම් ක්‍රම
- නූල් සහ නූල් වල වර්ණ ගැලපීම
- නිමාව (ල. 04)

(iv) 38cm (18")
සිසු පිළිතුර අනුව (ල. 06)
(මුළු ලකුණු 16)

07 (i) ස්වභාවික කෙඳි

ශාකමය කෙඳි (සෙලියුලෝස් කෙඳි)	සත්වමය කෙඳි (ප්‍රෝටීන් කෙඳි)	ඛනිජමය කෙඳි
● කපු	● සේද	● ඇස්බැස්ටස්
● ලිනන්	● ලෝම	● වීදුරු
● හෙම්ප්		
● ජූට්		
● රැමි		
● කැපොක් (කොට්ට පුළුන්)		
● හණ		
● සීසල්		
● අන්නාසි		

(ල. 03)

(ii) ● ජල අවශෝෂකතාවය ● තාපයේ බලපෑම ● හිරු එළියේ බලපෑම ● පවිත්‍ර කිරීමේ පහසු (ල. 03)

(iii)
- ජල රෝධක නිමාව
- ගිනි රෝධක නිමාව
- බැක්ටීරියා නාශක නිමාව
- සැන්ෆ්‍රයිස් කිරීම

විරංජනය
වැලි කඩදාසි භාවිතය
මැංගනේට් ඉසීම
එන්සයිම සේදීම

ඉන් එකක් පැහැදිලි කිරීමට ලකුණු ලබා දෙන්න (ල. 04)

(iv)



(ල. 06)

(මුළු ලකුණු 16)

08. (i)
- භෞතික සමාජීය සහ පීඩාවන් අවම කර ගැනීම
- ගෝලීය තිරසාරත්වයට දායකත්වය දැක්විය හැකි ප්‍රසන්න ජීවන පරිසරයන් ගොඩ නැගීම
- නිර්මාණශීලීව පර්යේෂණාත්මකව ජීවන පරිසරය වඩා ප්‍රසස්ථ මට්ටමකට ගෙන ඒමට හැකි වීම

(මෙම පිළිතුර පැහැදිලි කරන්න) (ල. 04)

(ii) ද්විතික වර්ණ දෙකක් සමාන ප්‍රමාණ වලින් මිශ්‍ර කල විට තෘතියික වර්ණ සෑදේ
- තෘතියික කහ = කොළ + තැඹිලි (නිල් + කහ) + (රතු + කහ)
- තෘතියික රතු = දම් + තැඹිලි - (නිල් + රතු) + (රතු + කහ)
- තෘතියික නිල් = කොළ + දම් - (නිල් + කහ) + (නිල් + රතු) (ල. 04)

(iii) ශරීර ස්කන්ධ දර්ශකය = $\frac{\text{ශරීරයේ බර (Kg)}}{\text{උස} \times \text{උස (මීටර්}^2\text{)}}$

B.M.I 18.5 ට අඩු - උසට අනුව බර ප්‍රමාණවත් නැත.

B.M.I 18.5 - 24.9 - උසට සරිලන බර ඇත.

B.M.I 25 - 30 - උසට අනුව බර වැඩිය. බර පාලනය කර ගත යුතුය

B.M.I 30 ට වැඩි - ස්ථූලතාවයෙන් පෙළෙන අතර දේහ බර අඩු කර ගත යුතුය (ල. 04)

(iv) කාබෝහයිඩ්‍රේට්

පිෂ්ටය - ජලය අඩු තත්වයකදී පිසීමේ දී දුඹුරු පැහැ කබොලක් හට ගනී (පාන්, බනිස්, රොටි)

සීනි - සීනි තාපය හමුවේ දියවී කැරමලීකරණය වී තව දුරටත් රත් කිරීමෙන් අඟුරු බවට පත්වේ.

ප්‍රෝටීන් - පිසීමේ දී ප්‍රෝටීන් කැටි ගැසීමට සහ හැකිලීමට ලක් වේ (බිත්තර සුදු මදය, මස්)

ලිපිඩ - තෙල් දියවී අධික උෂ්ණත්වයකදී පිළිස්සීමට භාජනය වේ.

(v) විරංජනය

රෙදි වල ඇති ස්වභාවික වර්ණය ඉවත් කොට සුදු කිරීම විරංජනය ලෙස හඳුන්වයි මේ සඳහා සෝඩියම් හයිප්‍රොක්ලෝරයිඩ්, හයිඩ්‍රජන් ඉපරොක්සයිඩ් වැනි ඔක්සිකාරක භාවිතා කරනු ලබයි. (ල. 04)

(මුළු ලකුණු 4 x 4 = 16)